# කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කිරින්ද පුහුල්වැල්ල ගම් සභා කාර්යාලයීය පැරණි ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී කඩා ඉවත්කර තිබුණද එකී දේපල අදාල වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම ගිණුම්ගත කිරීමේදී රු.458,674 ක් වූ බිල්කල ආදායම, ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු වෙනුවට වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.306,121 ක මුදල ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම ගිණුම්ගත කිරීමේදී රු.12,532 ක් වූ බිල්කල ආදායම ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු වෙනුවට ලැබී තිබූ රු.9,847 ක මුදල පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2009 ඔක්තෝබර් 01 සිට 2012 ඔක්තෝබර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාල රු.1,810,849 ක හිඟ කඩකුලී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය පරිදි සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබුණද එකී කපා හැරීම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා ලබාදී ඇති යතුරුපැදි සඳහා මන්ත්‍රීවරුන්ගෙන් අයකරගත් රු.180,000 ක මුදල වැටුප් හා දීමනා ගිණුම හර කොට වෙනත් ආධාර ගිණුම බැර කර නොතිබුණෙන් එම ප්‍රමාණයට වර්ෂයේ වියදම සහ ආදායම අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂවලට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු රු.61,233 ක මුදල ණයහිමියන් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2012 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබුණු මුද්දර ගාස්තු වල වටිනාකම රු.2,000,000 ක් වූ අතර ඊට අදාලව රු.3,290,498 ක මුදලක් ලැබී තිබුණි. ඒ අනුව රු.1,290,498 ක ඌන වෙන්කිරීම සමුච්චිත අරමුදල සමඟ ගැලපුම් කළ යුතු වුවද එය සිදුව නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශේෂයන්ගේ එකතුව රු.4,011,138 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව හා දෙන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.2,167,398 ක් වූයෙන් රු.1,843,740 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.421,235 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.50,768,719 ක් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුළත් රු. 102,486,591 ක් වටිනා විෂයයන් දොලහක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ලිපිකරුවන් විසින් එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළයුතු වරිපනම් ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේදී වරෙන්තු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217-218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව විසින් මිලදී ගන්නා ලද පරිගණක හා උපාංග සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |

1.3.7 බලය නොලත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය අනුව වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහස නොඉක්මවන සභාව විසින් දරන ලද වියදමක් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුඥාව ඇතිව වියදම් දැරිය යුතු වුවද ඊට පටහැනිව ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් 2013 නොවැම්බර් 21 දින රු.25,000 ක මුදලක් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.751,256 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.606,453 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,672 | 560 | 527 |
| බදුකුලී | 1,340 | 854 | 2,237 |
| බලපත්‍ර ගාස්තු | 237 | 144 | 170 |
| වෙනත් ආදායම් | 1,314 | 1,293 | 43,943 |

ඉහත දක්වා ඇති හිඟහිටි ආදායම් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 9(2) පරිදි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙසටත් වරිපනම් බදු සම්බන්ධයෙන් පනතේ 158(1)(ආ) වගන්තිය පරිදිත් ලේකම් කටයුතු කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු වෙන් වෙන්ව හඳුනා ගත හැකි පරිදි ලේඛන නඩත්තු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු රු.954,325 ක මුදලක් වර්ෂ ගණනාවක සිට සභා අරමුදලෙහි රඳවාගෙන තිබුණි.

(ආ) මුද්දර මිලදී ගැනීම් හා ලේඛන ගත කිරීමේ කාර්යය සභාවේ කාර්යාල කාර්ය සහායකට පවරා තිබූ අතර මුද්දර ලේඛනය වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි. තවද 2013 වර්ෂයේදී වවුචර 07 කින් මිලදී ගෙන තිබුණු රු.19,200 ක් වටිනා මුද්දර තොග මුද්දර මිලදී ගැනීම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

සභාවේ මන්ත්‍රීවරුන් හය දෙනෙකුට වර්ෂය තුල සභා වාර 12 ක් වෙනුවෙන් රු.438,000 ක දීමනාවක් 2013 වර්ෂයේදී ගෙවා තිබූ අතර දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අංක 1413/15 හා 2005 ඔක්තෝබර් 05 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 3 වන රීතිය 1(ii) විධිවිධාන වලට පටහැනිව රැස්වීම් වලට සහභාගී වී නොමැති සභිකයින් දෙදෙනෙකුට රු.89,500 ක මුදලක් සභික දීමනා ලෙස ගෙවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්ත |
|---|---|---|---|
| විධායක | 02 | 03 | 01 |
| ද්විතියික | 20 | 20 | |
| ප්‍රාථමික | 19 | 19 | |
| (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 06 | 06 |
| | 41 | 48 | 07 |

භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාව එසේ බඳවාගෙන තිබුණු සේවකයින් 07 දෙනෙකුට 2013 වර්ෂයේදී රු.664,052 ක මුදලක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී පහත විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් | ඇස්තමේන්තු ගත | තථ්‍ය | විචලනය | විචලනය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | |
| වරිපනම් හා බදු | 2,672 | 560 | 2,111 | 79 |
| කුලී | 1,340 | 854 | 486 | 36 |
| බලපත්‍ර ගාස්තු | 237 | 144 | 92 | 39 |
| සේවා ගාස්තු | 155 | 1,649 | 1,494 | 964 |
| වරෙන්තු ගාස්තු | 117 | 16 | 101 | 86 |
| වෙනත් ආදායම් | 3,910 | 2,594 | 1,316 | 34 |

වියදම්
-------

| | | | | |
|---|---|---|---|---|
| ගමන් වියදම් | 283 | 404 | 121 | 43 |
| සැපයුම් හා උපකරණ | 1,853 | 1,305 | 547 | 30 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යතා වෙනත් සේවා | 1,009 | 735 | 273 | 27 |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 335 | 204 | 130 | 39 |
| විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 401 | 226 | 175 | 44 |

මේ අනුව අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------
විගණන හා කළමනාකරණ කමිටු රැස්වී නොතිබුණි.

5. පද්ධති හා පාලන
------------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය